**සී/ස එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගමේ සහ එහි පරිපාලිතයන් - 2020**

---

**1. මූල්‍ය ප්‍රකාශන**

---

**1.1 තත්ත්වාගණනය කළ මතය**

---

සී/ස එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගමේ ("සමාගම") සහ සමාගමේ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන සහ එහි පරිපාලිතයන්හි ("සමූහය") 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශන සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශන, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශන සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශන සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, සමාගමේ සහ සමූහයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් කුඩා හා මධ්‍ය පරිමාණ අස්තිත්ව සඳහා වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට (කු ම ප අ සඳහා ශ්‍රී ලං මූ වා ප්‍ර) අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නාවූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

---

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරනපාර්ශවයන්ගේ වගකීම්**

---

මෙම මූල්‍ය ප්‍රකාශන කුඩා හා මධ්‍ය පරිමාණ අස්තිත්ව සඳහා වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට (කු ම ප අ සඳහා ශ්‍රී ලං මූ වා ප්‍ර) අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සමාගම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සමාගම ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර

අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සමාගමේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සමාගමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, සමාගමේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය

-----------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති වීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමේ, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම්කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය , ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව්කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව්කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත්කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ සමාගමේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ සමාගමේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, සමාගම ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 කුඩා හා මධ්‍ය පරිමාණ අස්තිත්ව සඳහා වූගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම (කු ම ප අ සඳහා ශ්‍රී ලං මූ වා ප්‍ර)

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ)ප්‍රමිතියේ 7.4 වගන්තියට පටහැනි වන ආකාරයට පුවත්පත් නියෝජිතායතන, නිත්‍ය දැන්වීම්කරුවන්, වීදි වෙළෙන්දන් ආදීන්ගෙන් ලැබුණු මෙහෙයුම් තැන්පතු හා කුලී ආදායම සඳහා ලද ආයෝජන තැන්පතු වටිනාකම පිලිවෙලින් රු.4,162,000 ක් හා රු.452,700 ක් මූල්‍ය මාර්ගයෙන් ලද මුදල් ප්‍රවාහ ලෙස හඳුනාගෙන තිබුණි. | සටහන් කර ගන්නා ලදී. 2021 වසරේදී මෙම දෝෂ නිවැරදි කිරීමට කටයුතු කරනු ඇත. | ප්‍රමිතියට අනුකූල වන පරිදි මුදල් ප්‍රවාහ පිළියෙල කළ යුතුය. |
| (ආ)ශේෂ පත්‍රයේ ඇතුළත් රු.2,056,967 ක් වූ තොග අයිතම කාණ්ඩ | තොග අයිතම කාණ්ඩ දෙකක් භෞතික තොගයේ නොතිබුණි. | භෞතික වශයෙන් නොමැති තොග, ශේෂ පත්‍රයෙන් ඉවත් කිරීමට |

| | | |
|---|---|---|
| දෙකක් තොගයේ භෞතික ව නොතිබුණි. | | කටයුතු කල යුතු ය. |
| (ඇ) ප්‍රමිතියේ **17.19** වගන්තිය පරිදි වත්කම්වල ඵලදායි ආයු කාලය සමාලෝචනය කළයුතු වුවත්, රු.**1,456,422,118** ක් වූ තවදුරටත් භාවිතා කරන සම්පූර්ණයෙන් ක්ෂය කරන ලද දේපල පිරියත සහ උපකරණ එපරිදි සමාලෝචනයක් හෝ ගිණුම්ගත කිරීමක් කර නොතිබුණි. | **2020** වසර තුළදී සමාගම දේපල පිරියත හා උපකරණවල ඵලදායි ආර්ථික ජීවකාලය සමාලෝචනය කිරීමට සැලසුම් කර තිබුණි. කෙසේවුව ද, රට තුළ පවත්නා කොවිඩ් **19** තත්ත්වයේ ප්‍රතිඵලයක් වශයෙන් මෙය ඉදිරි වසරවලදී සිදුකරනු ලබන අතර මෙම වර්ෂය ඇතුළත දී මූලික කටයුතු සිදුකරනු ඇත. | ප්‍රමිතියේ මාර්ගෝපදේශයන්ට අනුකූල ව සම්පූර්ණයෙන් ක්ෂය කරන ලද දේපල පිරියත සහ උපකරණවල ඵලදායි ආයු කාලය සමාලෝචනය කර ගිණුම්ගත කල යුතු ය. |
| (ඈ) කුඩා හා මධ්‍ය පරිමාණ අස්තිත්ව සඳහා වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතයේ **21.14 (බී) (සී)** සහ **(ඩී)** වගන්ති අනුව සමාගමට එරෙහිව පවතින නීතිමය නඩු **19** කට අදාළ ව වන්දි ගෙවීමේ අවිනිශ්චිතතාවය සහ කාලය හඳුනා ගැනීම, කිසියම් ප්‍රතිඵලයක් ලෙස අපේක්ෂිත වන්දි ගෙවීම්වල හෝ අයකර ගැනීම්වල ප්‍රමාණය හා කාලය, වගකීමේ ස්වභාවය පිළිබඳව අනාවරණය කර නොතිබුණි. | සටහන් කර ගන්නා ලදී. කෙසේ වෙතත්, වගකීම්වල ස්වභාවය සහ ප්‍රමාණය හේතුවෙන් පවතින නඩු පිළිබඳ කරුණු මූල්‍ය ප්‍රකාශනවල හෙළි කිරීමට සමාගමට නොහැකි වේ. සමාගමට එරෙහිව විභාග වෙමින් පවතින නඩු **31** ක් විනිශ්චය බලාපොරොත්තුවෙන් සිටින අතර ප්‍රතිපාදන පිළිබඳ විස්තර මූල්‍ය ප්‍රකාශනවල සටහන් අංක **19** යටතේ අනාවරණය කර ඇති අතර සියලු විස්තර පරීක්ෂා කිරීම සඳහා විගණනය වෙත ලබා දී ඇත. | ප්‍රමිතියෙන් නියම කර ඇති පරිදි, කිසියම් ප්‍රතිඵලයක් ලෙස අපේක්ෂිත වන්දි ගෙවීම්වල ස්වාභවය, ප්‍රමාණය හා කාලය හෙළිදරව් කළ යුතුය. |
| (ඉ) සමාගමට එදිරිව පවරා ඇති නඩු සඳහා වන්දි මුදලේ වටිනාකමින් **0.4** ක ප්‍රතිශතයක් මූල්‍ය ප්‍රකාශන තුල ප්‍රතිපාදනය කර තිබුණි. කෙසේ වෙතත්, සමාගම විසින් මූල්‍ය ප්‍රකාශන වාර්තාකරණ දිනට පැවැති ප්‍රතිපාදන සමාලෝචනය කර වගකීම් පියවීම සඳහා අවශ්‍ය වන්දි මුදල් ප්‍රමාණය උදෙසා පවත්නා හොඳම ඇස්තමේන්තුව කුඩා හා මධ්‍ය පරිමාණ අස්තිත්ව සඳහා වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ | නීතිමය නඩු සඳහා හොඳම ඇස්තමේන්තුව මනින ලද අතර යොදා ගන්නා ලදී. | කුඩා හා මධ්‍ය පරිමාණ අස්තිත්ව සඳහා වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතයේ **21.11** වගන්තියට අනුව සමාගම විසින් සෑම වාර්තාකරණ දිනයකදීම ප්‍රතිපාදනයන් සමාලෝචනය කර, වගකීම් පියවීමට අවශ්‍ය වන වන්දි මුදල් ප්‍රමාණය උදෙසා පවත්නා හොඳම ඇස්තමේන්තුව වාර්තා කිරීමට කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| ප්‍රමිතයේ 21.11 වගන්තියට අනුව වාර්තා කර නොමැත. | | |
| (ඊ)බාහිර පාර්ශ්ව දෙකක් විසින් සමාගමට එදිරිව ගොනු කරන ලද නඩු දෙකක් සඳහා වන්දි වශයෙන් රු.3,000,000 ක් සහ රු.10,000,000 ක මුදලක් ගෙවීමට අධිකරණය තීරණය කර තිබුණද, සමාගම මෙම වගකීම් මුදල මූල්‍ය ප්‍රකාශනවල සම්පූර්ණයෙන් හඳුනාගෙන නොතිබුණි. | නීතිමය නඩු සඳහා හොඳම ඇස්තමේන්තුව මනින ලද අතර යොදා ගන්නා ලදී. | රු.3,000,000 ක්සහ රු.10,000,000 ක් ගෙවීමට අධිකරණය තීන්දුවක් ලබාදී ඇති බැවින් ප්‍රතිපාදනයන් සම්පූර්ණයෙන් හඳුනාගත යුතුය. |
| (උ)කුඩා හා මධ්‍ය පරිමාණ අස්තිත්ව සඳහා වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතයේ 21.15 වගන්තියට අනුව, සමාගම ස්වයංක්‍රීය ප්‍රසම්පාදන කළමනාකරණ පද්ධතිය ස්ථාපිත කිරීමට අදාළව ගෙවීමට ඉතිරි වටිනාකම වන රු.1,300,000 ක් අසම්භාව්‍ය වගකීමක් ලෙස මූල්‍ය ප්‍රකාශන තුල හෙළිදරව් කර නොතිබුණි. | සටහන් කර ගන්නා ලදී. මෙම පද්ධතිය 2020 වර්ෂයේදී සම්පූර්ණයෙන් ම ක්‍රියාත්මක නොවූ අතර 2021 වසර වන විට සම්පූර්ණ කරනු ඇත. ඒ අනුව 2021 වර්ෂයේදී මුළු පිරිවැය හඳුනාගනු ලැබේ. | ප්‍රමිතියට අනුව හෙළිදරව් කළ යුතුය. |

**1.5.2** නොසැසඳූ පාලන ගිණුම් හෝ වාර්තා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය අවසානයේ භෞතික තොගය හා සැසඳීමේදී රු.4,841,848 ක වෙනසක් නිරීක්ෂය විය. | සටහන් කර ගන්නා ලදී. | මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට පෙර, හඳුනා නොගත් වෙනස්කම් සමථයකට පත්කර ගත යුතුය. |

**1.6** ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

**1.6.1** ලැබිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|

| | | |
|---|---|---|
| ----------------------- | ------------------------------------ | ------------ |
| (අ) 2020 දෙසැම්බර් 31 දිනට වෙළඳ ණයගැති ශේෂය රු.828,071,121 ක් වූ අතර ණයගැති වටිනාකම රු.662,071,986 ක් වන ණයගැතියන් 732 කුට ණයගැති තහවුරු කිරීමේ ලිපි යවන ලද අතර 2020 අප්‍රේල් 22 දින වන විට ණයගැති වටිනාකම රු.42,734,272 ක් වන ණයගැතියන් 68 දෙනෙකුගෙන් පමණක් ප්‍රතිචාර ලද අතර එය සියයට 6 ක ප්‍රතිශතයක් වන අතර ණයගැති වටිනාකම රු.14,623,502 ක් වන ණයගැතියන් 22 කු ණයගැති ශේෂ සමඟ එකඟ වී තිබුණි. මේ අතර, වෙළඳ ණයගැතියන්ගෙන් ණයගැති කාල සීමාව වසරක් ඉක්ම වූ වෙළඳ ණයගැති වටිනාකමරු.141,307,398 ක් වන අතර ණය අය කර ගැනීමට නොහැකිව නීති අංශයට යොමු කරන ලදවෙළඳ ණයගැති වටිනාකම රු.33,220,477 ක් වන අතර එය සියයට 24 ක ප්‍රතිශතයක් වේ. | විගණකාධිපති දෙපාර්තමේන්තුව විසින් එකඟ වූ පරිදි ජ්එන්සීඑල් විසින් රු.200,000 ට වැඩි ණයගැතියන් වෙත තහවුරු කිරීමේ ලිපි යවන ලදී. කෙසේ වෙතත්, ණයගැතියන් කිහිප දෙනෙකු පමණක් ප්‍රතිචාර දැක්වූ අතර මෙම තත්ත්වය අපගේ පාලනයෙන් තොර වේ. යවන ලද තහවුරු කිරීමේ ලිපි සඳහා ප්‍රතිචාර (එකඟ වී හෝ එකඟ නොවී) නොතිබුණ ද, 2020 දෙසැම්බර් 31 වන දිනට හිඟ ශේෂයන් බොහෝමයක් 2021 මැයි 6 දින වන විට පියවා ඇත.<br><br>එකතුව රු. **141,307,398** ක් වන වසරකට වැඩි කාලයක් නොගෙවූ වෙළෙඳ ණයගැතියන් යටතේ පෙන්නුම් කරන ශේෂය, බොල් ණය සඳහා ප්‍රතිපාදනයට වෙන් කර ඇත.<br><br>එකතුව රු. **33,220,477** ක් වන උසාවි ලෙජරය යටතේ පෙන්වා ඇති ශේෂය හිඟ ණය අයකර ගැනීම සඳහා ගනුදෙනුකරුවන්ට එරෙහිව ගොනු කර ඇති නීතිමය ක්‍රියාමාර්ග නියෝජනය කරයි. | ණයගැති ලෙජරයේ ඇති ශේෂයන් තහවුරු කර ගැනීමට ණයගැතියන්ගෙන් තහවුරු කිරීම් ලබා ගත යුතුය.<br><br>හිඟ ශේෂයන් අයකර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ආ)අදාළ සේවකයන් විශ්‍රාම යාම, සේවය අවසන් කිරීම හෝ මියයාම නිසා සමාගමෙන් ඉවත්වීම හේතුවෙන්, කාලය වසර 1 සිට 20 දක්වා අයකර නොගත් එකතුව රු.6,881,484 ක් වූ ශේෂය ද සේවකයන්ගෙන් ලැබිය යුතු ශේෂය තුල දක්නට ලැබුණි. | මෙම ශේෂය විශ්‍රාම යාම හෝ මියයාම හේතුවෙන් සේවය අවසන් කිරීම නිසා දැනටමත් ඉතිරිව ඇති, සේවකයන්ගෙන් ලැබිය යුතු මුදල් නියෝජනය කරයි.<br><br>පාරිතෝෂික පනත මගින් මෙම ලැබිය යුතු මුදල් අඩු කිරීම් සඳහා ප්‍රතිපාදන සපයා නොමැති බැවින් සමාගමට මෙම මුදල් අවසාන පාරිතෝෂිකයෙන් අඩු කළ නොහැක. තවද, අර්ථසාධක අරමුදල් ප්‍රතිපාදන අනුව අරමුදල් ශේෂයෙන් 25%ක් අනිවාර්යයෙන් නිදහස් කළ යුතුය. ඒ අනුව, ලැබිය යුතු කාර්ය මණ්ඩල ශේෂයන් සඳහා තවදුරටත් අඩු කිරීම් කළ නොහැක.<br><br>කෙසේ වෙතත්, ඉහත කාර්ය මණ්ඩල ලැබිය යුතු මුදල් අයකර | ණය නිකුත් කරන අවස්ථාවේදී සේවකයන්ගේ වයස, ආපසු අයකර ගැනීමේ හැකියාව සහ ධාරිතාව පිළිබඳව ඇගැයීමට ලක් කළ යුතුය. |

| | | |
|---|---|---|
| | ගැනීමට සමාගම පහත පියවර ගෙන ඇත.<br>• සේවය අවසන් කළ සේවකයන් හට ඉතිරිය පියවන ලෙස දන්වමින් සිහි කැඳවුම් ලිපි යැවීම.<br>• අදාළ ඇපකරුවන්ගේ නොපියවන ලද ආපදා ණය ශේෂ තුලින් පියවා ගැනීමට දැනටමත් ක්‍රියාමාර්ග ගෙන ඇත. | |
| (ඇ)සමාගම රජයේ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, සංස්ථා සහ මහජනතාවට සමාගමේ ප්‍රකාශන සඳහා ග්‍රාහක මුදල් ගෙවීමට ඉඩ දී තිබුණි. කෙසේ වෙතත්, **2020** දෙසැම්බර් **31** දිනට ග්‍රාහක ගිණුමේ දක්වන ලද හිඟ ශේෂය රු.**14,899,522** ක් විය. ඉන්, රු. **2,171,715** ක් **2011** වසරේ සිට **2020** දක්වා හිඟව පැවතුණි. කෙසේවුවද, සමාලෝචිත වර්ෂය අවසානය වන විට ද, මෙම වටිනාකම අයකර ගැනීමට කිසිඳු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | ග්‍රාහක මුදල් පදනමේ වැඩි කොටසක් රාජ්‍ය අංශයට සම්බන්ධ වේ. මීට පෙර රාජ්‍ය හා පෞද්ගලික යන දෙඅංශයටම ණය පහසුකම් ප්‍රදානය කරන ලද නමුත් ණය පහසුකම් ලබා දීම විධිමත් කිරීමේ ප්‍රතිඵලයක් ලෙස පෞද්ගලික අංශයේ ග්‍රාහකයින් අත්හිටුවන ලදී. රජයේ ග්‍රාහකයින් සඳහා ලබා දුන් වසරක ණය පහසුකම ද මාස තුනකට හෝ හයකට සීමා කර ඇත. රට තුළ පවතින කොවිඩ් **19** වසංගත තත්ත්වය හේතුවෙන් රාජ්‍ය අංශය වෙත නිකුත් කර ඇති කොවිඩ් **19** මාර්ගෝපදේශවලට අනුගත වීමට සිදු වීමෙන් ග්‍රාහක මුදල් එකතු කර ගැනීම දුෂ්කර කාර්යයක් විය. මෙම බාධාවන් මධ්‍යයේ වුවද එකතු කිරීමේ ක්‍රියාවලිය කඩිනම් කිරීමට විශේෂ වැඩපිළිවෙළක් සකස් කර ඇත. | ග්‍රාහකත්වය මත පුවත්පත් බෙදා හරින විට, අයකර ගැනීම් ද නිරීක්ෂණය කළ යුතුය. |

## 1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| **2003** ජුනි **02** දිනැති අංක පීඊඩී/**12** දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ | | | |
| **(i)9.3.1** වගන්තිය | සමාගමේ බඳවා ගැනීම් හා උසස්වීම් යෝජනා ක්‍රමය සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය සහ රාජ්‍ය | රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව මුදල් අමාත්‍යාංශයේ විෂය පථය යටතේ ක්‍රියාත්මක වේ. රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ | සමාගමට රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛවලින් බැහැර වීමට අවශ්‍ය නම්, මහ පෙන්වීමක් ලබා ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ එකඟත්වය ලබාගෙන නොතිබුණි. | ප්‍රකාශිත ලැයිස්තුවට අනුව, ඒඑන්සීඑල් එකී දෙපාර්තමේන්තුවේ අධීක්ෂණයට යටත් නොවේ. එබැවින්, නියම කරන ලද චක්‍රලේඛ ඒඑන්සීඑල් සඳහා අදාළ නොවේ. | |
| **(ii)9.4** වගන්තිය | මෙම වගන්තියට පටහැනිව, සමාලෝචිත වර්ෂය තුළ රාජ්‍ය ආයතන සඳහා මාධ්‍යවේදීන් නව දෙනෙකු, කර්තෘවරුන් හතර දෙනෙකු, සහකාර කළමනාකරුවෙකු ඡායාරූප ශිල්පියෙකු, ජ්‍යෙෂ්ඨ විධායකවරයෙකු සහ මුදල් අයකැමියෙකු ඇතුළු නිලධාරීන් **17** දෙනෙකු නිදහස් කර ඇති අතර එම සේවකයන්ගේවැටුප්, වේතන හා දීමනා ලෙස රු.**5,476,800** ක් සමාගම විසින් දරා ඇත. මාධ්‍යවේදීන් නව දෙනෙකු, කර්තෘවරුන් හතර දෙනෙකු නිදහස් කළද, සමාලෝචිත වර්ෂය තුළදී මාධ්‍යවේදීන් විසිහය දෙනෙකු සහ කර්තෘවරුන් විසිතුන් දෙනෙකු කොන්ත්‍රාත් පදනම මත අලුතින් බඳවාගෙන තිබුණි. | ජනාධිපති කාර්යාලය, අග්‍රාමාත්‍ය කාර්යාලය සහ ජනමාධ්‍ය අමාත්‍යාංශය මගින් අපගේ සේවකයින් කිහිප දෙනෙකුගේ සේවය ලබා දෙන ලෙස කළ ඉල්ලීම මත ඔවුන් වැටුප් සහිතව නිදහස් කිරීමට කළමනාකාරිත්වය අනුමැතිය ලබා දී ඇත. | සමාගමට රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛවලින් බැහැර වීමට අවශ්‍ය නම්, ඒ සඳහා අනුමැතියක් ලබා ගත යුතුය. |
| **(iii)7.4.1**වගන්තිය | විගණන හා කළමනාකරණ කමිටුව අවම වශයෙන් මාස තුනකට වරක්වත් ක්‍රමාණුකූලව | සටහන් කර ගන්නා ලදී. | රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව, විගණන හා කළමනාකරණ කමිටු පැවැත්විය යුතුය. |

| | | | |
|---|---|---|---|
| | රැස්විය යුතු වුවත්, සමාලෝචිත වර්ෂය තුළ දී කමිටු රැස්වීම් පවත්වා නොතිබුණි. | | |
| **(iv)5.2.5** වගන්තිය | අධ්‍යක්ෂක මණ්ඩලය විසින් අයවැය ලේඛනය අනුමත කළ පසු ඉදිරි වර්ෂය ආරම්භ වීමට දින **15** කට පෙර රේඛීය අමාත්‍යාංශය, රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව, මහා භාණ්ඩාගාරය සහ විගණකාධිපති වෙත යොමු කළ යුතුය. කෙසේ වෙතත්, සමාගම එම අවශ්‍යතාවයට අනුකූල නොවී තිබුණි. | භාවිතයක් ලෙස, අනුමත වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්මේ පිටපතක් ජනමාධ්‍ය අමාත්‍යාංශයට පමණක් යොමු කරයි. වාර්ෂික අයවැයේ පිටපතක් (ආදායම් හා වියදම් අයවැය සහ කැපෙක්ස් අයවැය) මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමත් සමඟ විගණකාධිපති වෙත යොමු කරනු ලැබේ. | රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව, අධ්‍යක්ෂක මණ්ඩලයේ අනුමැතිය ලත් අවසාන යාවත්කාලීන අයවැය ලේඛනය ඉදිරි වර්ෂය ආරම්භ වීමට දින **15** කට පෙර රේඛීය අමාත්‍යාංශය, රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව, මහා භාණ්ඩාගාරය සහ විගණකාධිපති වෙත යොමු කළ යුතුය. |

## **2.** මූල්‍ය සමාලෝචනය

---------------------

### **2.1** මූල්‍ය ප්‍රතිඵල

-------------

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.**217,840,000** ක පාඩුවක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ පාඩුව රු.**216,105,000** ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.**1,735,000** ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට සමාලෝචිත වර්ෂය තුළ පරිපාලන වියදම් හා මූල්‍ය වියදම්වල ඉහළයාම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

පසුගිය වර්ෂ හතරේ සහ සමාලෝචිත වර්ෂය සඳහා සමාගමේ මූල්‍ය ප්‍රතිඵල විශ්ලේෂණය කිරීමේ දී, **2016** සිට **2020** දක්වා අගය එකතුවීම උච්චාවචනය වී තිබුණි. කෙසේවුවද,සේවක වැටුප් හා ක්ෂයවීම් සැලකිල්ලට ගැනීමෙන් පසු (ලාභාංශ සහ සාධාරණ අගය ගැළපීමට පෙර) **2019** වර්ෂයේ ධනාත්මක සියයට **7** ට සාපේක්ෂව **2020** වර්ෂයේ දී සියයට **27** ක අඩුවීමක් පෙන්නුම් කරමින් අගය එකතුවීම පිළිවෙලින් රු.**1,456,099,000** සහ රු.**1,061,269,000** ක් විය. විස්තර පහත දැක්වේ.

| | වටිනාකම රු. **’000** | | | | |
|---|---|---|---|---|---|
| | **2020** | **2019** | **2018** | **2017** | **2016** |
| බදු පසු ලාභය (ලාභාංශ හා සාධාරණ අගය ගැලපීමට පෙර) | (196,155) | (189,856) | (152,897) | 180,015 | 32,239 |
| සේවක වැටුප් | 1,187,819 | 1,552,385 | 1,420,009 | 1,288,996 | 1,331,922 |
| වීආර්එස් පිරිවැය | - | - | - | - | 163,513 |
| ක්ෂයවීම් | 69,605 | 93,570 | 88,825 | 89,401 | 83,344 |

| | | | | | |
|---|---|---|---|---|---|
| මුළු දායකත්වය | **1,061,269** | **1,456,099** | **1,355,937** | **1,558,412** | **1,611,018** |
| පෙර වර්ෂය හා සැසදීමේදී ප්‍රතිශතාත්මක වැඩිවීම / අඩුවීම | (27)% | 7% | (13)% | (3)% | 11% |

**2.2 අනුපාත විශ්ලේෂණය**

-----------------------

**ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනයන්ට අනුව සමාගමේ වැදගත් ගිණුම්කරණ අනුපාත කිහිපයක් පහත දැක්වේ.**

| | 2020<br>ප්‍රතිශතය | 2019<br>ප්‍රතිශතය |
|---|---|---|
| දළ ලාභ ආන්තිකය | **51.75** | **47.02** |
| ලකුණු කළ ලාභය (විකුණුම් පිරිවැය මත දළ ලාභය) | **107.28** | **88.75** |
| පිරිවැටුම මත පරිපාලන පිරිවැය | **51.88** | **44.89** |
| පිරිවැටුම මත විකුණුම් හා බෙදාහැරීම් පිරිවැය | **16.25** | **12.28** |
| පිරිවැටුම මත මූල්‍ය පිරිවැය | **3.49** | **3.47** |
| ජංගම අනුපාතය | **1.70** | **1.51** |
| ක්ෂණික අනුපාතය | **1.25** | **1.03** |
| යෙදවූ ප්‍රාග්ධනය මත ප්‍රතිලාභය | **(28)** | **(23)** |

**ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂය සඳහා සමාගමේ දළ ලාභ ආන්තිකය හා ලකුණු කළ ලාභය පිළිවෙලින් සියයට 4.73 කින් හා සියයට 18.53 කින් වැඩි වී තිබුණි. ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ දී පිරිවැටුම මත පරිපාලන පිරිවැය සියයට 6.99 කින් වැඩි වී තිබුණි. යෙදවූ ප්‍රාග්ධනය මත ප්‍රතිලාභය සියයට ඍණාත්මක 28 කි.**

**3. මෙහෙයුම් සමාලෝචනය**

--------------------------------

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

------------------------------------

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| **(අ) 2020 දෙසැම්බර් 31 දින වන විට රු.26,800,895 ක් වටිනා අගරු චෙක්පත් 263 ක් විය. ඉන් රු.2,155,046 ක් වටිනා චෙක්පත් 60 ක් සහ රු.216,802 ක් වටිනා චෙක්පත් 10 ක් පිළිවෙලින් වසර 5 ට සහ වසර 3 ට වඩා** | **විගණනයට සපයා ඇති ලැයිස්තුව තුළ ප්‍රචාරක ආදායම් ලෙජරය, නිත්‍ය පාරිභෝගික ලෙජරය සහ පුවත්පත් නියෝජිතායතන ලෙජරයට අදාළ අගරු චෙක්පත් දැක්වේ.**<br><br>**එම ලැයිස්තුව තුළ අගරු** | **පවතින පද්ධතිය අවධානයෙන් මෙහෙයවිය යුතුය.** |

| | | |
|---|---|---|
| හිඟව පැවතුණි. | චෙක්පත්වල පහත තොරතුරු දක්වයි.<br>• චෙක්පත් ආපසු පැමිණීමේ දිනය<br>• සේවාදායකයාගේ නම<br>• චෙක්පත් අංකය<br>• චෙක්පතෙහි වටිනාකම<br>අගරු චෙක්පත්වල වර්තමාන තත්ත්වය | |
| (ආ) සමාගම කොටස් **1200** ක් මිලදී ගැනීම සඳහා **2008** දෙසැම්බර් මස රු.**1,200,000** ක් අතුරු ගෙවීමක් ලෙස ලංකා පුවත් සමාගම - ශ්‍රී ලංකාවේ ජාතික පුවත් නියෝජිතායතනයට ගෙවා තිබුණ ද, **2020** දෙසැම්බර් **31** දින වන විටත් ප්‍රතිලාභයක් ලැබී නොතිබුණි. තවද, **2017** දී ලංකා පුවත් සමාගමේ සේවකයන් තිදෙනෙකුට වැටුප් සහ වේතන ලෙස ගෙවූ රු.**2,194,637** ක් අයකර ගැනීමකින් තොරව **2020** දෙසැම්බර් **31** දින වනවිටත් ලැබිය යුතු ලෙස පෙන්වා තිබුණි. | සටහන් කර ගන්නා ලදී. අධ්‍යක්ෂ මණ්ඩල තීරණ එල්කේපීබී **202.17** පදනම් කරගෙන ඒඑන්සීඑල්, ලංකා පුවත් සමාගමේ කොටස් **1200** ක ආයෝජනය කර තිබුණි. **2018** වසරේදී සේවකයන් දෙදෙනෙක් ඒ වන විටත් ඉවත් වී තිබුණු අතර එක් සේවකයෙක් ඒඑන්සීඑල් සේවක ලැයිස්තුවට එකතු වී තිබුණි. නවතම ගැසට් දැන්වීමෙන් (**2020** අගෝස්තු **10**) මෙම ආයතනය මාධ්‍ය අමාත්‍යාංශය යටතේ ගැසට් කර තිබුණි. | ප්‍රතිලාභ ලබා ගැනීම සඳහා ආයෝජනයන් කළ යුතුය. |
| (ඇ) දින **720** ට වඩා හිඟව පැවති එකතුව රු.**7,673,033** ක් වූ ණය අයකර ගැනීම සඳහා ණයගැතියන් අට දෙනෙකුට එරෙහිව ක්‍රියාමාර්ග ගැනීමට සමාගම අසමත්ව තිබුඅතර ඔවුන් සමඟ කරන ලද ගනුදෙනු සම්බන්ධයෙන් අදාළ ආධාරක ලියවිලි අස්ථානගත වීම ඊට හේතුවී ඇත. | සටහන් කර ගන්නා ලදී. අදාළ දෙපාර්තමේන්තුවේ ආධාරක ලියකියවිලි නොතිබීම හේතුවෙන් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. නිවැරදි කිරීමට සහ මෙවැනි දෑ ඉදිරියේදී සිදුනොවීමට පියවර ගෙන ඇත. | ලේඛන භාරකාරත්වය පිළිබඳව වගකීම් නිශ්චය කළ යුතුය. |
| (ඈ) **1981** ඔක්තෝම්බර් **14** දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රයේ අංක **162/5** යටතේ "මාධ්‍යවේදීන් සඳහා වූ ආචාර ධර්ම සංග්‍රහය" පළ කර තිබුණද, **2019** දෙසැම්බර් **31** දින වන විට | කොළඹ දිසා අධිකරණයේ එම නඩුවේ කටයුතු පරීක්ෂා කිරීමේදී, **2010** ඔක්තෝම්බර් **20** වැනි දින දිසා අධිකරණ අංක **3** හි නඩුව කැඳවා ඇති අතර විත්ති පාර්ශ්වයේ නීතිඥවරයා අංක **1** දිසා අධිකරණයේ සිටි බැවින් එය ඒක පාර්ශ්වීය නඩු විභාගයක් සඳහා නියම කර ඇත. | සමාගමට එදිරිව පවතින අපහාස නඩු අවමකර ගැනීමට සමාගම කටයුතු කළ යුතුය. |

සමාගමට එදිරිව අපහාස නඩු 15 ක් ගොනු කර තිබුණි. සමාගමට එරෙහිව පවරා ඇති නඩු 15 න් එක් අපහාස නඩුවක් 2007 නොවැම්බර් 18 වැනි දින සති අන්ත පුවත්පතක් වන "සිළුමිණ" හි පළ වූ ලිපියක් සම්බන්ධයෙන් වන අතර පැමිණිලිකරු සමාගමෙන් රු.මිලියන 500 ක් ඉල්ලා ඇත. මෙම නඩුව 2010 වර්ෂයේ කොළඹ දිසා අධිකරණයේ කැඳවූ අවස්ථාවේදී උසාවියේ වග උත්තරකරුවන් සහ සමාගමේ නීතිඥවරයා අදාළ උසාවි කාමරයට පැමිණ නොතිබුණි. ඒ අනුව පැමිණිල්ලට පක්ෂව තීන්දුව ලබා දීමට අධිකරණය තීරණය කර තිබුණි. සමාගම මෙම තීන්දුවට එරෙහිව දිසා අධිකරණයේ සහ සිවිල් අභියාචනා මහාධිකරණයේ පෙත්සම් ගොනුකර තිබුණ ද, පෙත්සම් දෙකම ප්‍රතික්ෂේප වී තිබුණි. අනතුරුව, 2019 අගෝස්තු 30 දින දී, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ඔවුන්ගේ තීරණ අංක එෆ් 104.19 මගින් ශ්‍රේෂ්ඨාධිකරණයට අභියාචනයක් ඉදිරිපත් කිරීමට හා මෙම නඩුවට සමාගම වෙනුවෙන් ඉදිරිපත් කිරීමට ජ්‍යෙෂ්ඨ ජනාධිපති නීතිඥවරයෙකු හා ඔහුගේ සහායකයින් තෝරා ගැනීමට තීරණය කර තිබුණි. ඒ අනුව ඔවුන්ගේ නීති ගාස්තු ලෙස සම්පූර්ණ මුදල රු.18,230,000 ක් 2019 ඔක්තෝබර් 09 දින ගෙවා තිබුණු අතර මෙම නඩුව සඳහා වැරදි උසාවි කාමරයට පෙනී සිටි නීතිඥවරයා විසින්ම නීතිඥවරුන් තෝරාගැනීම සිදුකර අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කර තිබුණි. විත්තිකරු වෙනුවෙන් පෙනී නොසිටි බැවින්, විත්තිකරුට (ඒඑන්සීඑල්) එරෙහිව ඒක පාර්ශ්වීය නඩු විභාගයක් සඳහා එය නියම කර ඇත. මෙම නඩුව 2010 ඔක්තෝම්බර් 20 වැනිදා විභාගයට නියමිතව තිබිණි. 2010 සැප්තැම්බර් 30 වැනි දින පැමිණිල්ලේ ලියාපදිංචි නීතිඥවරයා විසින් මෝසමක් ගොනු කර තිබුණේ පැමිණිලිකරු විදේශගත වී ඇති බැවින් 2010 ඔක්තෝම්බර් 20 වැනි දින පෙනී සිටිය නොහැකි බවයි. එම නිසා කෙසේ හෝ අදාළ දිනයේ දී නඩුව විභාගයට ගැනීමට හැකියාවක් තිබුණේ නැත.

කෙසේ වෙතත්, මෙම නඩුව අංක 3 දිසා අධිකරණයේ ඉදිරිපත් වී ඇති අතර, එහිදී පැමිණිලිකරුට උසාවියේ පෙනී සිටීමට නොහැකි බවට මෝසමක් ගොනු කර ඇති බව අධිකරණය දැනුවත් නොකර, පැමිණිලිකරුගේ ලියාපදිංචි නීතිඥවරයා විසින් විත්තිකාර පාර්ශ්වයේ නීතිඥවරයා නොපැමිණීමේ අයුතු ප්‍රයෝජන ගනිමින් ඒක පාර්ශ්වීය නඩු තීන්දුවක් ලබා ගෙන ඇත.

ඒක පාර්ශ්වීය තීන්දුව අහෝසි කිරීම සඳහා සිවිල් අභියාචනා මහාධිකරණයට අභියාචනයක් ඉදිරිපත් කර තිබුණි. නමුත්, එම අභියාචනයද සිවිල් අභියාචනා මහාධිකරණය විසින් ප්‍රතික්ෂේප කර තිබුණි. සඳහන් කරන ලද සහනය බලාපොරොත්තුවෙන් මෙම නඩුව මේ වනවිට ශ්‍රේෂ්ඨාධිකරණයේ ඇසීමට නියමිතව ඇත.

මෙම නඩුව අවසානයකට ළගාවී නොමැති බැවින් සහ ශ්‍රේෂ්ඨාධිකරණයේ නඩුවඇසීම අවසන් වන තෙක් දිසා අධිකරණය ලබා දුන් ඒක පාක්ෂික තීන්දුව ක්‍රියාත්මක කළ නොහැකිය. එබැවින්, ඒඑන්සීඑල් විසින් සමාගමේ නීතිඥයාට වෘත්තීමය වශයෙන්

| | | |
|---|---|---|
| තවද, මෙම නීතිඥවරයා **2020** අප්‍රේල් **08** දින විශ්‍රාම ගොස් තිබුණු අතර **2020** මැයි **15** දින කොන්ත්‍රාත් පදනම මත නැවත බඳවාගෙන තිබුණි. මේ දක්වා එම නිලධාරියාට එරෙහිව කිසිදු විනය ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | නොසැලකිලිමත්බව මත විනය පරීක්ෂණ පැවැත්වීම පිළිබඳව නිගමනය කිරීමට මම අසමත් වෙමි.<br><br>**2020** මැයි **15** සිට **2020** නොවැම්බර් **14** දක්වා කොන්ත්‍රාත් පදනම මත ඇයගේ සේවය තවත් මාස **6**කට දීර්ඝ කරමින් සේවා දිගුව ලබා දීමට අධ්‍යක්ෂක මණ්ඩලයට සිදු වූයේ**2020** මාර්තු **11** වැනිදා සිට කොවිඩ් **19** ව්‍යාප්ත වීමෙන් පසු පවතින තත්ත්වය යටතේ අදාළ සියලුම ලියකියවිලි පිළිබඳව සමීප එකම නිලධාරිනිය වන නිසා සහ කෙටි කාලයකට දීර්ඝ කිරීමකින් තොරව ඇයගේ සේවය නතර කළහොත් එය කළමනාකාරිත්වයට මෙන්ම අධ්‍යක්ෂක මණ්ඩලයට දැඩි අපහසුතාවයක් ඇති කරනා බැවිනි. කෙසේ වෙතත්, එම දීර්ඝ කිරීමේ කාලය අවසන් වීමෙන් පසුව, ඇයට තවදුරටත් සේවා දිගුවක් ලබා දී නොමැත. පසුව, ඇය වෙනුවට **2020.11.15** දින සිට බලාත්මක වන පරිදි නව පත්වීමක් ලබාදී ඇත. | |
| (ඉ)දේපළ සංවර්ධන ව්‍යාපාරයේ නියැලීම සඳහා **1985** දී ආරම්භ කරන ලද ලේක් හවුස් ප්‍රොපර්ටි ඩිවලොප්මන්ට් (පුද්ගලික) සමාගමෙහි මෙහෙයුම් මාර්ගයෙන් ලද කිසිදු මුදල් ප්‍රවාහයක් සමාලෝචිත වර්ෂය අවසානය තෙක්ම දක්නට නොලැබුණි. | සටහන් කර ගන්නා ලදී. | ක්‍රියාත්මක නොවන ආයතන සම්බන්ධයෙන් තීරණයක් ගත යුතුය. |

**3.2** මෙහෙයුම් අකාර්යක්ෂමතා

---------------------------

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ)සමාගමට එහි ප්‍රකාශන මුද්‍රණය කිරීමට යන්ත්‍ර තුනක් පැවතිය ද “ගොස් අර්බන් ලයිනර්” සහ “එම් හැරිස්” නම් වූ යන්ත්‍ර දෙක පිළිවෙලින් **1993** සහ **1979** සිට භාවිතා කර ඇති අතර | සටහන් කර ගන්නා ලදී. ජනමාධ්‍ය අමාත්‍යාංශයේ සහ මුදල් අමාත්‍යාංශයේ සහාය ඇතිව නව වෙබ් මුද්‍රණාලයක් මිලදී ගැනීමට සමාගම සැලසුම් කරයි. | යන්ත්‍රවල තාක්ෂණික තත්ත්වය කළමනාකරණය කිරීමට නිසි ක්‍රියාමාර්ගයක් ගත යුතුය. |

| | | |
|---|---|---|
| තාක්ෂණික තත්ත්වයන් පිරිහී ඇත. කෙසේ වෙතත්, විශාල ආයෝජනයක් සිදු කිරීමට නොහැකි වූ බැවින් නව යන්ත්‍රෝපකරණ සඳහා ආයෝජනය කිරීමට සමාගමට නොහැකි වී ඇත. | | |
| (ආ) 2020 වර්ෂයේ දී "රස" හා "තිනකරන්" පුවත්පත් දෙකෙහි නශාවීම් පිළිවෙලින් සියයට 10 සහ සියයට 12 දක්වා වැඩි වී ඇත. එලෙසම, "සරසවිය" "ආරෝග්‍යා" සහ "වන්නවානවිල්" නම් වාර සඟරා තුනෙහි නශාවීම් පිළිවෙලින් සියයට 12, සියයට 14 සහ සියයට 15 කින් වැඩි වී ඇත. | වෙබ් ඕෆ්සෙට් මුද්‍රණ යන්ත්‍ර භාවිතා කරනුයේ ලාගර් මුද්‍රණ ඇණවුම් සඳහා ය. මුද්‍රණ ඇණවුම් අඩු වන විට, නශාවීමේ ප්‍රතිශතය ඉබේම ඉහළ යයි. | නශාවීම් අඩු කළහැකි ආකාරය සමාගම හඳුනාගත යුතුය. |
| (ඇ)මාස 3 ක් තුළ ඉදිරිපත් නොකළ චෙක්පත් 69 ක් රු.43,546,959 ක් වන අතර, සමාලෝචිත වර්ෂය අවසානයේ ජංගම ගිණුමේ මාස 3 කට වඩා වැඩි කාලයක් සෘජු ලෙස ප්‍රේෂණය කළ මුදලින් රු.4,938,221 ක් වූ චෙක්පත් 277 ක් පරීක්ෂාවට ලක් නොවී තිබේ. | මාස 3 සිට මාස 9 දක්වා කාලය තුළ පැහැදිලි කර නොගත් තැන්පතු රු.590,807 ක චෙක්පත් 18 ක් සම්බන්ධයෙන් ලංකා බැංකුවෙන් සියලු විස්තර ඉල්ලනු ලැබීය. රටේ පවතින තත්ත්වය හේතුවෙන් සමාගමට අදාළ තොරතුරු පසුගිය දා ලංකා බැංකුවෙන් ලබා ගන්නා ලදී. එම තොරතුරුවලට අනුව සමාගම 2021 මැයි මස අවසන් වන විට පැහැදිලි කර නොගත් තැන්පතු ලැයිස්තුව නිෂ්කාශනය කර ගෙන ඇත. ඉදිරිපත් නොකළ චෙක්පත් රු.මිලියන 43.5 ක චෙක්පත්වලින් රු.මිලියන 41 ක චෙක්පත් එක්සත් ප්‍රවෘත්ති පත්‍ර අර්ථසාධක අරමුදලට නිකුත් කර ඇත. මෙම පිළිතුරේ දිනය වන විට සමාගම චෙක්පත් නැවත වලංගු කර නිකුත් කර ඇත. | තැන්පත් කරන ලද සහ නිකුත් කරන ලද චෙක්පත් හැසිරවීමට සමාගම විසින් නිසි අභ්‍යන්තර පද්ධතියක් හඳුන්වා දිය යුතුය. |
| (ඇ)භාවිතයක් ලෙස, සමාගම විසින් කළමනාකාරිත්වය, ඇතැම් විධායක සේවකයින්, ජනාධිපති, අගමැති, ජනමාධ්‍ය අමාත්‍ය, අමාත්‍යාංශ ලේකම්වරුන්, හිටපු කළමනාකාරිත්වයේ සාමාජිකයන්, සේවා කාලය වසර 20 ට වැඩි සේවකයින්, සේවා කාලය වසර 25 | විවිධ කාණ්ඩවලට නොමිලේ පිටපත් යැවීම පිළිබඳව කළමනාකරණය අවධානය යොමු කර ඇත. මැතකදී, ආයතනික අංශය සඳහා නොමිලේ පිටපත් යැවීමේ ක්‍රියාවලිය සමාලෝචනය කර පිරිවැය අවම කිරීම සඳහා නවත්වන ලදී. තව ද, මෑතකදී වාර්තාකරුවන් හට නොමිලේ පිටපත් නිකුතුව නැවැත්වීමට | නොමිලේ පිටපත් ලබා ගන්නා පාර්ශ්වයන් වරින් වර යාවත්කාලීන කළ යුතු අතර අඩු කිරීමට උත්සාහ කළ යුතුය. |

| | | |
|---|---|---|
| සම්පූර්ණ හා විශ්‍රාම ලත් සේවකයින් වෙත නොමිලේ ප්‍රකාශන පිටපත් නිකුත් කර ඇත. ඒ අනුව, සමාලෝචිත වර්ෂය තුළ ප්‍රධාන පුවත්පත් හතෙන් පිටපත් **1,005,525** ක් සහ වාර සඟරා **14** කින් පිටපත් **78,285** ක් නොමිලේ නිකුත් කර ඇත. මුද්‍රිත පිටපත් අතරින් වැඩිම නොමිලේ පිටපත් ප්‍රමාණයක් නිකුත් කර ඇත්තේ සියයට **16** ක ප්‍රතිශතයක් නියෝජනය කරමින් "දිනමිණ" පුවත්පතිනි. මෙම නොමිලේ පිටපත් සඳහා වැය වූ මුදල රු.**66,234,169** ක් වේ. | ක්‍රියාමාර්ග ගෙන ඇත. කළමනාකරණ ප්‍රතිපත්තියට අනුව සේවා කාලය වසර **20** හා **25** සම්පූර්ණ කර විශ්රාම ලත් සේවකයින්ට නොමිලේ පිටපත් පිරිනැමේ. | |
| (ඉ)සමාලෝචිත වර්ෂය තුළ පුවත්පත් **7** කින් සහ වාර සඟරා **14** කින් ආපසු එවූ සමස්ත පිටපත් ප්‍රමාණය **3,003,922** ක් වන අතර වැඩිම ආපසු එවූ පිටපත් ලෙස වාර්තා වූයේ "දිනමිණ" පුවත්පත වන අතර එය සියයට **21** ක ප්‍රතිශතයකි. | **2019** සහ **2020** වර්ෂවල විකුණුම් ඉලක්ක සංසන්දනයේදී කොවිඩ් **19** වසංගත තත්ත්වය සලකා බැලීම වැදගත් වේ. **2020** මාර්තු, අප්‍රේල්, සහ ඔක්තෝම්බර් මැද වන විට මුළු රටම වසා තිබුණි. මෙම පාලනය කළ නොහැකි වසංගත තත්ත්වය හේතුවෙන් අලෙවි ආදායම සියයට **30** කින් පහත වැටී තිබුණි. කෙසේ වෙතත්, අපගේ විකුණුම් වැඩි කර ගැනීම සඳහා අප කණ්ඩායමක් ලෙස කොවිඩ් **19** වසංගත තත්ත්වය සමඟ සටන් වදිමින් සිටී. | ආපසු ලැබෙන පිටපත් අඩු කිරීමට පියවර ගත යුතුය. |

## 3.3 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) නිවාස යෝජනා ක්‍රමයක් ඉදිකිරීම සඳහා මිලදී ගත් හෝකන්දර ප්‍රදේශයේ අක්කර **8** ක ඉඩමක් **1985** වසරේ සිට නිෂ්ක්‍රීයව පවතී. | සටහන් කර ගන්නා ලදී. **2013** වර්ෂයේ දී ලේක්හවුස් ප්‍රොපර්ටි ඩිවලොප්මන්ට් සමාගමෙන් හෝකන්දර ඉඩමේ අයිතිය ඒඑන්සීඑල් වෙත පවරාගෙන ඇති අතර වීආර්එස් සහ කාරක ප්‍රාග්ධන අවශ්‍යතා සඳහා **2016** වසරේදී කොමර්ෂල් බැංකුවෙන් ණය ලබාගැනීමට උකස් කර ඇත. | සමාගම වත්කම් සමාගමේ යහපත සඳහා උපයෝජනය කිරීමට කටයුතු කළ යුතුය. |

## 3.4 මානව සම්පත් කළමනාකරණය

--------------------------------

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ)2020 මාර්තු 26 දින වන විටත්, 2017 ජූනි 6 දින සකස් කරන ලද සේවක සංඛ්‍යාව සඳහා අධ්‍යක්ෂක මණ්ඩල අනුමැතිය ලබාගෙන නොතිබුණි. එම සේවක සංඛ්‍යාවට අනුව පොදු සහ කර්තෘ දෙපාර්තමේන්තු සඳහා කාර්ය මණ්ඩල සංඛ්‍යාව පිළිවෙලින් 658 ක් සහ 327 ක් විය. කෙසේ වෙතත්, පොදු සහ කර්තෘ දෙපාර්තමේන්තුවල සත්‍ය කාර්ය මණ්ඩල පිළිවෙලින් 964 ක් සහ 483 ක් වූ අතර එකතුව 1447 ක් විය. එබැවින්, 2020 දෙසැම්බර් 31 දිනට අතිරික්ත කාර්ය මණ්ඩලය 462 ක් වූ අතර ඉන් 434 ක් කොන්ත්‍රාත් පදනම මත වේ. කාර්ය මණ්ඩලයේ පිරිවැය, සමාලෝචිත වර්ෂයේ සහ පෙර වර්ෂයේ ආදායමෙන් ප්‍රතිශතයක් ලෙස පිළිවෙලින් සියයට 62 ක් සහ සියයට 53 ක් විය. | සමාගම විසින් 2012 ජූලි 01 වැනි දින සකස් කරන ලද සේවක සංඛ්‍යාව වෙනුවට 2017 ජූනි 6 දින සේවක සංඛ්‍යාවක් සකස් කර ඇත. 2017 ජූනි 6 දින සේවක සංඛ්‍යාව අනුව පොදු පරිපාලනය සහ කර්තෘ පරිපාලනය සඳහා අනුමත කාර්ය මණ්ඩල සංඛ්‍යාව පිළිවෙලින් 658 ක් සහ 327 කි. ලේක්හවුස් ආයතනය සඳහා සකස් කරමින් පවතින උපාය මාර්ගික සැලැස්ම මත පදනම්ව සහ ස්වයංක්‍රීයකරණයෙන් සහ සැලසුම් කර ඇති හෝ ක්‍රියාත්මක වෙමින් පවතින පද්ධතියෙන් (ඊආර්පී, විකුණුම්, තොරතුරු තාක්ෂණ පද්ධතිය, ජාල උත්ශ්‍රේණි කිරීම, එච්ආර්අයිඑස් පද්ධති ආදිය) මතුවන කාර්යක්ෂමතාවය සැලකිල්ලට ගනිමින් මෙම සේවක සංඛ්‍යාව සකස් කර ඇත.නව ප්‍රකාශන හඳුන්වාදීම හා ඉංග්‍රීසි පුවත්පත්වල උසස් ප්‍රමිතීන් පවත්වා ගැනීම සඳහා කොන්ත්‍රාත් පදනම මත ආයතනයට නව පත්වීම් ලබාදීමට සිදු විය. 2021 මැයි 17 වන විට ස්ථිර සේවකයින් 921 ක් සහ කොන්ත්‍රාත් සේවකයින් 435 ක් සේවයේ නියුතු වේ. ජනමාධ්‍ය අමාත්‍යාංශයේ සම්බන්ධීකරණයෙන් අනුමත සේවක සංඛ්‍යාවක් සැකසෙමින් පවතී. | අධ්‍යක්ෂක මණ්ඩල අනුමැතිය ලබාගත යුතුය. |
| (ආ)2017 වසරේදී උපදේශකවරයෙකුට රු.2,250,000 ක් ගෙවා සකස් කර ගන්නා ලද දක්ෂතා අත්පත් කර ගැනීම, උසස් කිරීම, නිවාඩු ප්‍රතිපත්තිය, කාර්ය සාධන කළමනාකරණය ආදී ප්‍රතිපත්ති හතක් සමාගම විසින් භාවිතා කර තිබුණද, 2020 දෙසැම්බර් 31 දිනට අධ්‍යක්ෂක මණ්ඩල අනුමැතිය ලැබී තිබුණේ | උපදේශකවරයෙකුගේ උපදෙස් ඇතිව ප්‍රතිපත්ති හතක් සකස් කරන ලදී. ඒ අතරින්, කාර්ය සාධන කළමනාකරණ ප්‍රතිපත්තිය අධ්‍යක්ෂක මණ්ඩලය විසින් අනුමත කරන ලදී. අනෙකුත් ප්‍රතිපත්ති අනුමැතිය සඳහා අධ්‍යක්ෂක මණ්ඩලයට ඉදිරිපත් කර ඇත. | සියලුම ප්‍රතිපත්ති සඳහා අධ්‍යක්ෂක මණ්ඩල අනුමැතිය ලබාගත යුතුය. |

**කාර්ය සාධන කළමනාකරණ ප්‍රතිපත්තිය සඳහා පමණි.**